**(රාජ්‍ය/ අර්ධ රාජ්‍ය නිලධාරීන්/ බාහිර පුද්ගලයින් සඳහා)**

අවසාන දිනය – **2026.07.06**

# ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

"ආසියානු සංවර්ධන බැංකුව මගින්අරමුදල් සපයනු ලබන දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනෙහි (iRoad 2 වැඩසටහන)" පහත සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සහඅර්ධ රාජ්‍ය නිලධාරීන් ඇතුළු ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ මාර්ග ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා බත්තරමුල්ල ප්‍රදේශය පදනම් කරගනිමින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවා ඇති අතර අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක, බස්නාහිර, උතුරු, නැගෙනහිර සහ ඌව පළාත්වල පිහිටුවා ඇත. මෙම පත්වීම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2026.03.28 දින නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 විධිවිධානවලට යටත් වේ.

**ව්‍යාපෘතියේ නම - දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoad 2 වැඩසටහන)**

**(ඇමරිකානු ඩොලර් මිලියන 25-200 කාණ්ඩය)**

| අංකය | තනතුරු නාමය | කළමනාකරණ සේවාදෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක:02/2026 ට අනුව වැටුප් කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | පාරිසරික නිලධාරී (PIU - ඌව) | F | 01 |
| 02 | පාරිසරික නිලධාරී (PIU - බස්නාහිර) | F | 01 |
| 03 | සමාජ ආරක්ෂණ නිලධාරී (PIU- උතුර) | F | 01 |
| 04 | රියදුරු - (PMU) | සහායක කාර්ය මණ්ඩලය PL 3-2025 | 01 |
| 05 | රියදුරු - (PIU - බස්නාහිර) | | 02 |
| 06 | රියදුරු - (PIU - නැගෙනහිර) | | 01 |
| 07 | රියදුරු - (PIU - උතුර) | | 01 |

**කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 2/2026 හි ඉහත සඳහන් ඇමුණුම 01 ට අනුව, සමාජ ආරක්ෂණ නිලධාරී, පාරිසරික නිලධාරී (F) (ඇමරිකානු ඩොලර් මිලියන 25-200 කාණ්ඩය) තනතුර සඳහා වන මූලික සුදුසුකම් පහත දැක්වේ.**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [(1) හෝ (2) හෝ (3) පහතින්]**

**1.**

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්.

හෝ

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 7 ට නොඅඩු, තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

- අවශ්‍ය වන විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 02 ක පළපුරුද්ද.

**2.**තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)මට්ටම 6 ට නොඅඩු,තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළවප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

- අවශ්‍ය වන විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්ද.

**3.**තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)මට්ටම 5 ට නොඅඩු, තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීණතා සහතිකයක්ලබා තිබීම.

සහ

- අවශ්‍ය වන විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 08 ක පළපුරුද්ද.

**ඉහත සඳහන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවක්‍රලේඛ අංක:2/2026 ට අනුව, රියදුරු PL 3 – 2025 (සහාය කාර්ය මණ්ඩලය) සඳහා වන මූලික සුදුසුකම් පහත දැක්වේ.**

- අ.පො.ස. (සා/පෙළ) විභාගයදෙවරකට නොවැඩි වාර ගණනකදී,භාෂාව හා තවත් විෂයයකට සම්මාන සාමාර්ථ දෙකක් (2) ක් ඇතුළුව විෂයයන් හයකින් (6) සමත්ව තිබීම

සමඟ

- රියදුරු බලපත්‍රය - වාහන කාණ්ඩ C සහ C1 හෝ
- නව රියදුරු බලපත්‍රයේ B කාණ්ඩය

සමඟ

- වසර 3 ක පළපුරුද්ද

<u>සාමාන්‍ය කොන්දේසි :</u>

- බඳවා ගැනීම්, වැටුප්, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි, මුදල් අමාත්‍යාංශය විසින් 2026.03.28 දින නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛඅංක:02/2026හි දක්වා ඇති විධිවිධානවලට අනුකූල වේ.
- තෝරා ගැනීම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛ කොන්දේසි මත පදනම් වේ.
- සියලුම අයදුම්පත් මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව පුරවා අදාළ ලේඛනවල සියලුම පිටපත් එවිය යුතුය.

- එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**01. වයස් සීමාව:**

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධාරීන් සඳහා අවුරුදු 60 ට අඩු
- අනෙකුත් පුද්ගලයින් සඳහා අවුරුදු 64 ට අඩු

**02. වැටුප:**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක:02/2026 මත පදනම්ව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**03. රැකියාවේ කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරේ.
- අයදුම්කරු දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල ස්ථිර තනතුරක් දරන්නේ නම්, පත්වීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක:02/2026හි2.3.3 ඡේදයේ සඳහන් කර ඇති, නිත්‍ය තනතුරේ පත්කිරීමේ බලධාරියා විසින් නිර්දේශ කරන ලද නිදහස් කිරීමේ පදනම අනුව සහ සලකා බලනු ලබන නිවැරදි නිදහස් කිරීමේ පදනම මත පදනම් වේ.
- අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර නොමැති සහ අයදුම්පත සමඟ නිවැරදි දත්ත ඉදිරිපත් කර නොමැති අපේක්ෂකයින් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක:02/2026 හි නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහ අනෙකුත් අවශ්‍යතා සපුරා නොමැති අපේක්ෂකයින් පත්වීම් සඳහා සලකා බලනු නොලැබේ.
- තෝරාගනු ලැබුවහොත් අපේක්ෂකයින් දිවයිනේ සහ/හෝ ප්‍රදේශයේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට එකඟ විය යුතු ය.
- පත්වීම ලබා දීම හෝ නොදීම සහසේවය දීර්ඝ කිරීමේ තීරණය, අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදිචක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධානයන්ට අනුකූලව සිදු කෙරේ.

**04. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ පූර්ණ වශයෙන් රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දැනටමත් දරන අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා හරහා සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක:02/2026හි 2.3.3 ඡේදයට අනුව නිත්‍ය තනතුරෙන් නිදහස් කිරීමේ කැමැත්ත සහ නිදහස් කිරීමේ පදනමේ නිර්දේශය ඇතිව එවිය යුතුය. (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

**05. අයදුම්පත ඉදිරිපත් කිරීම**

පහත දක්වා ඇති ආකෘතියට අනුව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අධ්‍යයන සුදුසුකම් පිළිබඳ විස්තර, මූලික උපාධියේ විස්තරාත්මක පිටපත, සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ,

දැන්වීමේ දැක්වෙන තනතුරේ සහ ව්‍යාපෘතියේ නම එම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ලිඛිතව සඳහන් කර, ලේකම්,ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,"මගනැගුම මහමැදුර", අංක:216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයට 2026.07.06 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දීමෙන් අමාත්‍යාංශයේ පාලන අංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

**06. විශේෂ අවධානය සඳහා**

- **ලබාදී ඇති ආකෘතියට අනුකූලව නිසි ලෙස පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **අයදුම්පත සමග සහතික කරන ලදපිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණක් තෝරා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.**

**07. ඕනෑම විමසීමක් සඳහා කරුණාකර අමතන්න - 011-2271048**

**08. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කර ඇති මෙම දැන්වීමෙහි භාෂා පාඨ අතර යම් නොගැලපීමක් තිබේ නම්, සිංහල දැන්වීමේ ඇති කරුණු බලපැවැත්වෙනු ඇත.**

අයදුම්පත්‍ර ආකෘතිය - ඇමුණුම 1
ඇමුණුම 2

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**